

## ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමග හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

දිවයින පුරා ශාඛා 272 කින් යුත් ශාඛා ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බළකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ප්‍රතිඵල අභිමුඛ දක්ෂ කාර්යශූර පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

# සහකාර කළමනාකාර - නීති

**රැකියා ස්ථානය : නීති අංශය - උතුරුමැද පළාත**

### ප්‍රධාන වගකීම්

- ණය උකස්කර ඔප්පු ලියා සහතික කිරීම සහ බැංකුව වෙනුවෙන් අනෙකුත් නෛතික ලේඛන සකස් කිරීම සහ සහතික කිරීම.
- නෛතික කාරණා සහ අධිකරණයේ නඩු සම්බන්ධයෙන් බැංකුවේ නිලධාරීන් සමග සම්බන්ධීකරණය කරමින් කටයුතු කිරීම
- කළමනාකාරීත්වය විසින් යොමු කරනු ලබන කාරණාවලට අදාළව ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් සහ මණ්ඩලයේ නීතිඥවරුන් (Panel Lawyers) සමග උපදේශන සාකච්ඡා පැවැත්වීම.
- පැමිණිලි, දිවුරුම් ප්‍රකාශ සහ පෙත්සම් කෙටුම්පත් කිරීම. අදාළ අධිකරණවල නඩු පැවරීම සහ නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- අනෙකුත් සියලුම නෛතික කටයුතු

### මූලික සුදුසුකම්

- නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ධූරය දැරීම. නීතිවේදී උපාධියක් සහිතවීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

  (ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකම හෝ බැංකු/ මූල්‍ය අංශයේ වෘත්තීය විභාගවලින් සමත්වීම අමතර සුදුසුකමක් වේ.)

  **සහ**

  නීතිඥ සහ නොතාරිස් කටයුතුවල අවම වශයෙන් වසර 2 ක පළපුරුද්ද හෝ රජයේ හෝ පුද්ගලික ආයතනයක / නීති ආයතනයක නීති කටයුතුවල වසර 2 ක අවම පළපුරුද්ද ලබා තිබිය යුතුය. බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වේ.
- තෝරාගත් අයදුම්කරුවන් සතුව අදාළ අධිකරණ කලාපය තුළ භාෂා දෙකෙන්ම (සිංහල සහ ඉංග්‍රීසි) කටයුතු කිරීමේ හැකියාව සහිත නොතාරිස් බලපත්‍ර ලබා තිබිය යුතුවේ.
- පරිගණක දැනුම තිබිය යුතුවේ.
- වයස : අවුරුදු 40 ට අඩු විය යුතුයි.
- මූලිකව වසර 02 කොන්ත්‍රාත් කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.

### තෝරා ගැනීමේ ක්‍රමවේදය

අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව අයදුම්කරුවන් තෝරාගෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

### වැටුප්

තෝරා ගන්නා ලද අයදුම්කරුවන්ට ආකර්ෂණීය වැටුප් පරිමාවක් පිළිබඳව සාකච්ඡා කර තීරණයකට එළඹීමට යෝජනා කළ හැක.

### අයදුම් කිරීම සඳහා අවසන් දිනය

2023 ජනවාරි 20

### අයදුම් කළ යුතු ආකාරය

මෙම තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින් අධ්‍යාපනික/ වෘත්තිමය සහතික පත්වල සහතික කරන ලද පිටපත් සහිතව ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පතෙහි නම, ලිපිනය, දුරකථන අංකය සහිතව ඥාතීන් නොවන වෘත්තීමය පුද්ගලයන් දෙදෙනෙකුගේ තොරතුරු ද ඇතුළත් කර එවිය යුතු අතර, තැපැලෙන් යොමු කරන්නේ නම් අයදුම්කරන තනතුර අයදුම්පත්‍රය බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නැතහොත් එම අයදුම්පත් careers@rdb.lk ඊමේල් ලිපිනයට යොමු කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
0112 42 52 62 | www.rdb.lk